# හැමදමත් පුවත් මවන පොළොන්නරුවේ වී

මෙරට ආහාර පරිභෝජන රටාව තුළ මූලික ස්ථානයේ පසුවන ආහාර ද්‍රව්‍ය සහල් වුව ද අස්වනු නෙළන සමයත් සමඟම නිසි මිලකට වී විකුණා ගත නොහැකි වීම මාධ්‍ය හරහා නිරන්තරයෙන් ඉස්මතු කරනු ලබන ගැටළුවක් බවට පත් ව ඇත. මෙම ගැටලුව තුළද පොලොන්නරුවේ වී අලෙවිය පිළිබඳ ගැටලුව බෙහෙවින් ඉස්මතු කරනු ලබයි. යල-මහ දෙකන්නය ඇතුළත් ව ශ්‍රී ලංකාවේ සමස්ත වගාබිම් ප්‍රමාණයෙන් 42%ක වී වගාව ව්‍යාප්තව ඇත. අම්පාර, පොළොන්නරුව, අනුරාධපුරය, හම්බන්තොට, කුරුණෑගල ආදී වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්කයන් අතුරින් වී වගා බිම් ප්‍රමාණය මෙන් ම අස්වනු ප්‍රමාණය ද අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කය පසුවන්නේ දෙවැනි ස්ථානයේ ය. ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් 15%ට ආසන්නව නිෂ්පාදනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය සම්බන්ධ මතුවන ගැටලු සහ දුෂ්කරතා පිළිබඳ මෙම ලිපියෙන් සාකච්ඡා කෙරේ.

වී අලෙවියේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු ඇසුරුම් කිරීමේ සිට වී අලෙවි කර මුදල් ගැනීම දක්වා වූ ක්‍රියාදාමය පුරා ම පැතිර පවතී. පූර්ව අලෙවි අවස්ථාවේ දී ගොවීන් ඇසුරුම් සම්බන්ධ ව මෙන් ම ප්‍රවාහන හා ගබඩාකරණ පහසුකම් සම්බන්ධ ව වූ ගැටලුවලට ද මුහුණපානු ලබයි.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් 93% ක් පමණ වී ඇසුරුම් කිරීම සඳහා හිස් පොහොර මලු භාවිතා කරන අතර රු.15.00 - 20.00ත් අතර මිලකට ලබා ගන්නා එවැනි ඇසුරුම් මල්ලක් උපරිම වශයෙන් කන්න දෙකකට වඩා පාවිච්චි කිරීමට නොහැකි වීම නිසා ඇසුරුම් මලු සඳහා වාර්ෂික ව ඉහළ මිලක් වැය කිරීමට සිදුවීම ඔවුන් පූර්ව අලෙවි අවස්ථාවේ දී මුහුණදෙන එක් ගැටළුවකි. වී අලෙවි කිරීමේ දී ද, ඇසුරුම් සම්බන්ධ ගැටලුවට මුහුණ දීමට ගොවීන්ට සිදු වන නමුත් ය බොහෝ දුරට රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේ දී පමණක් සිදුවේ. මන්දයත්, පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේ දී වෙළෙන්ඳ විසින් ඇසුරුම් මලු සම්බන්ධ ගැටළුවකට මුහුණ දීමට සිදු නොවන හෙයිනි.

කමතේ සිට නිවසටත්, නිවසේ සිට වෙළඳ මධ්‍යස්ථානයටත් වී ප්‍රවාහනයේ දී සැලකිය යුතු මුදලක් ප්‍රවාහනය වෙනුවෙන් වැය කිරීමට සිදු වේ. නගරයෙන් දුරස්ථ මාර්ග සහ ප්‍රවාහන පහසුකම් පද්ධති දියුණු වී නොමැති දුෂ්කර ප්‍රදේශවල ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතාව වැනි ගැටලුන්ට මුහුණ දීමට ද ගොවීන්ට සිදු වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ වී කිලෝ ග්‍රෑම් 50ක මල්ලක් කිලෝ මීටරයක් හෝ එයට අඩු දුරක් ප්‍රවාහනය කිරීම සඳහා රු.10.00 - 12.00ත් අතර මුදලක් ගෙවීමට ගොවියාට සිදු වේ. මේ අනුව වී කිලෝ ග්‍රෑම් එකක්, කිලෝ මීටරයක දුරක් ප්‍රවාහනය කිරීම සඳහා ශත 20-24 අතර මුදලක් වැය වේ. කෙසේ වුවද, මනම්පිටිය සහ ඇළහැර බකමූණ ප්‍රදේශවල වී ප්‍රවාහනය සඳහා ගොවීන් විසින් අමතර වියදමක් දරනු නො ලැබේ. එයට හෙතුවන්නේ, මෙම ප්‍රදේශවල ගොයම් කැපීම, පෑගීම, නිවසට වී ප්‍රවාහනය කිරීම, අට්ටි ගැසීම යන සියලු කාර්යයන් කොළ මැඬීම කරනු ලබන ට්‍රැක්ටර්කරුවන් විසින් ප්‍රථමයෙන් ගිවිසගත් මුදලකට සිදු කරනු ලැබීමයි. එමෙන් ම, මෙම ප්‍රදේශවල පවතින ප්‍රවාහන අපහසුතා නිසා වෙළඳ මධ්‍යස්ථාන කරා වී රැගෙන යාම අඩුවෙන් සිදු වන අතර නිවසට පැමිණෙන වෙළෙඳුන්ට වී විකිණීම සිදු වේ.

'නිසි මිලකට වී අලෙවිකර ගත නොහැකිවීම', පොළොන්නරුවේ වී සම්බන්ධයෙන් බොහෝ විට අසන්නට ලැබෙන මැසිවිල්ලකි. වීවල අඩු ගුණාත්මක තත්ත්වය මේ සඳහා බලපානු ලබන ප්‍රධාන සාධකයකි. විශේෂයෙන් ම, මනම්පිටිය ගොවි ජන සේවා බල ප්‍රදේශය අයත් වන එගොඩ පත්තුවේ වී දිළීර රෝගයන්ට බඳුන්වීම, වීවල වර්ණය අවපැහැ වීම, වී ඇට සම්පූර්ණ නො වීම, ශුද්ධ කරගත් ලියැද්දක් තුළ පඩංගු රහිතව ගොයම් කොළ මැඬීම නිසා වීවලට ගල්, වැලි, මුසු වීම ආදී ගුණාත්මක තත්ත්වයන්ට බලපානු ලබන සාධකවලින් පහළ මට්ටමක පැවතීම නිසා එම ප්‍රදේශයේ වී සඳහා ලැබෙන මිල අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. මෙයට අමතර ව මැදිරිගිරිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ බේබියාවැව ප්‍රදේශයෙන් ද මෙම තත්ත්වය දැකිය හැකිය. මෙම ප්‍රදේශවල වී කිලෝ ග්‍රෑමයක් සඳහා ලැබෙන්නේ රජයේ වී මිලට ගැනීමේ මධ්‍යස්ථානයන්හි මිලට වඩා රු.2.00-3.00 ක් පමණ අඩුවෙනි.


**එම්.කේ.නදීකා දමයන්ති**

***පර්යේෂණ නිලධාරිණී,***

**කෘෂි ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයුම් අංශය,**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

මෙම තත්ත්වයන්ට අමතර ව වී අලෙවි කිරීමේ දී ගොවීන් ව්‍යාපාරිකයන්ගේ විවිධ වංචනික කිරුම් මිනුම් ක්‍රමවලට හසුවීම ද දකිය හැකිය. ව්‍යාපාරිකයින් විසින් වංචනික ආකාරයෙන් වී කිරීම සඳහා උපයෝගී කර ගන්නා ක්‍රම කිහිපයකි. එනම්,

- තරාදියේ ඊයම් කොටස් ඉවත් කිරීම
- වී මල්ලක බරෙන් කිලෝ ග්‍රෑම් එකක් පමණ අඩු කිරීම
- තරාදියේ (දුණ්ඩු කොටස්) වෙනස් කිරීම, බ්ලේඩ් වැනි ද්‍රව්‍ය තැබීමෙන් මිනුම්වල වෙනස්කම් ඇති කිරීම තුළින් වැඩි බරක්, අඩු බරක් ලෙස තහවුරු කරමින් වී මැනීම ඒ අතර ප්‍රධාන උපක්‍රම වේ.

වී ගොවිතැනින් තම ප්‍රධාන ජීවනෝපාය මාර්ගය සලසා ගන්නා ගොවීන්ට එදිනෙද ගෘහ අවශ්‍යතා සහ වගාවේ අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් ණයගැති භාවයට පත් වීම සිදුවන අතර මෙය විධිමත් සහ අවිධිමත් යන අංශ දෙක ම සම්බන්ධ කරගනිමින් සිදු වේ. අස්වනු නෙළීමේ ශ්‍රමික කුලී පවා බොහෝ විට අස්වනු අලෙවියෙන් ලැබෙන මුදලින් ගෙවීමට ගොවීන්ට සිදු වන අතර මෙම හේතූන් මත අස්වනු නෙළා අවසන් වීමත් සමඟ තම වී අලෙවි කර ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් ගොවීන් තුළ පවතී.

ගොවීන් පාරිභෝගික ද්‍රව්‍ය සහ කෘෂි යෙදවුම් ලබා ගන්නා වෙළඳසැල් බොහෝ විට වී මිලට ගැනීමේ කාර්යයේ නිරත වන අතර මෙමඟින් ගොඩ නගා ගන්නා සම්බන්ධතාව ඔස්සේ ගොවීන්ගේ වී මිලට ගැනීමට ද ව්‍යාපාරිකයා සමත් වේ. මේ ආකාරයට වී මිලට ගැනීමේදී බහුල වශයෙන්ම සිදුවන්නේ ව්‍යාපාරිකයා කමතට පැමිණ වී මිලට ගැනීමේ කටයුතු කිරීමයි. ව්‍යාපාරිකයා කමතට පැමිණ වී මිලට ගැනීමේ දී ඇසුරුම් හෝ ප්‍රවාහන වියදම් දැරීමට ගොවියාට සිදු නොවුනද මෙහිදී ගොවියාට ලැබෙන්නේ අනෙක් අවස්ථාවල දී (ගොවි නිවාස, අලෙවි මධ්‍යස්ථාන, වී මෝල්) ලබන මුදලට වඩා අඩු මිලකි. මෙහි දී ව්‍යාපාරිකයා විසින් වී මිල තීරණය කිරීම සිදුකරන අතර ගොවියා සහ ව්‍යාපාරිකයා අතර පවතින සම්බන්ධතාව නිසා මෙම රාමුවෙන් පිට පැනීමේ අපහසුතාවකට ගොවියා මුහුණ දෙනු ලබයි. අනෙක් අතට රාජ්‍ය අංශය විසින් වී මිලට ගැනීමේ කටයුතු සිදු කරනු ලැබුවත්, අස්වනු නෙළන සමය ආරම්භ වීමත් සමඟ රාජ්‍ය අංශයේ වී අලෙවි මධ්‍යස්ථාන ආරම්භ නො කිරීම, සීමිත වී ප්‍රමාණයක් පමණක් මිලට ගැනීම, එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයකින් විශාල භූමි ප්‍රමාණයක් ආවරණය වන පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කයක ඇතැම් විට ග්‍රාම නිලධාරි කොට්ඨාස 2-3 ආවරණය වන පරිදි එක් මිල දී ගැනීමේ මධ්‍යස්ථානයක් පිහිටු වීම නිසා වැඩි දුරක් වී ප්‍රවාහනය කිරීමට සිදු වීම වැනි ගැටලුන්ට මුහුණදෙන ගොවියා මෙවැනි තත්ත්වයක් තුළ අඩු මිලකට හෝ පෞද්ගලික අංශයට වී අලෙවි කරනු ලබයි.

*28 වෙනි පිටුවෙන්...........*

**කෙසෙල් සහ වෙනත්...........**

පදම් කර හොදි වැනි දියර දැමීමට බඳුනක් ලෙසින්, එනම් පැති මුලක් ආකාරයට සකසා ගත හැකිය.

කෙසෙල් දවටනයක් නැවත භාවිතා කරන විට ඉඳුල් සෝද ඉවත් කර නැවත වරක් නටන වතුරේ ගිල්වා ඉවතට ගෙන පවනේ වියළීමට තැබිය යුතු ය. මේ ආකාරයට එම දවටනය ඉරී යන තුරු ම නැවත භාවිතා කළ හැකි ය.

මෙසේ කෙසෙල් පත්‍ර ලබා ගැනීම සඳහා කෙසෙල් වගාවක් පවත්වා ගැනීමෙන් කැන්වලට අමතර වශයෙන් ආදයමක් ලබා ගත හැකිය.

**හෙක්ටයාරයක කෙසෙල් වගාවකින් ලබා ගත හැකි ආදයම**

සිටුවන ගස් සංඛ්‍යාව - 3300
ගසකින් පත්‍ර 10 බැගින් - 33000
එක් පත්‍රයකින් දවටන 4 බැගින්
දවටන ගණන - 132000
එක් දවටනයකින් ශත 50 බැගින් අලෙවි කළ විට ආදයම - 66000
කැන්වලට අමතර ව පත්‍රවලින් ලැබෙන ආදයම රු. - 66000
ක් වේ.

කෙසෙල් පත්‍රවලට අමතර ව නෙළුම් කොළ, කැන්ද කොළ, හල්මිල්ල කොළ, දියපර කොළ, බුත්සරණ කොළ (අරලුප්), වල් බෙලි කොළ, කොට්ටම්බා කොළ, ඕලු කොළ, සූරිය කොළ ආදිය ද සාර්ථකව යොදාගත හැකි ය. එහෙත් ඒවා කෙසෙල් පත්‍ර තරම් දිගු කලක් තබා ගත නොහැකි අතර ඒ ඒ අවස්ථාවට අනුව භාවිතා කල හැකිය. මේ සෑම ස්වාභාවික පත්‍රයකින් ම ප්‍රණීත ආහාර පාර්සලයක් සකස් කර ගත හැකි ය.

පසුගිය ද ගරු කෘෂිකර්ම අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පැවති වැඩමුළුවක දී ගෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ කාර්යභාර පර්යේෂණ නිලධාරි ආචාර්ය සුජාතා වීරසිංහ මහත්මිය විසින් කරන ලද දේශනය ඇසුරිනි.